# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2480/45 - 2026 මාර්තු මස 20 වැනි සිකුරාදා - 2026.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 277/40 (iv)

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

18 වන වගන්තිය යටතේ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 18 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය හිනිදුම සුනිල් සෙනෙවි වන මම, මේ නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා "ආරක්ෂිත ස්මාරක" වශයෙන් සලකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරමි.

මේ නියමයේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්මාරක සම්බන්ධයෙන් වන දැන්වීම පුරාවස්තු ආඥාපනතේ 19 වන වගන්තිය ප්‍රකාරව 2025 අප්‍රේල් මස 10 වැනි දින අංක 2431/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.*

ආචාර්ය **හිනිදුම සුනිල් සෙනෙවි,**
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2026 පෙබරවාරි මස 16 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ප්‍රකාශයට පත් කරනු ලබන ආරක්ෂිත ස්මාරක ලේඛනය***

1. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බතමුරේ අංක 10 ඒ ග්‍රාම නිලධාරි වසමට අයත් නවගමුව ග්‍රාමයේ පිහිටි බඩබද්ද නමැති කුඹුරේ ඇති පැරණි ඌර කැට ළිඳ සහ ඒ වටා මීටර් පහක (05) භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $7^{0}$309480 හා නැගෙනහිර දේශාංශ $80^{0}$391572).


1A - G 46496 — 04 (2026/03)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මීදූම 4ඊ ග්‍රාම නිලධාරි වසමට අයත් මීදූම මහින්දාරාම විහාර භූමියේ පිහිටි -

   *(අ)* ලෙන් විහාරය සහ එහි සිට උතුරු හා දකුණු දිශාවලින් මීටර් තුනක් (03) ද නැගෙනහිර හා බටහිර දිශාවලින් මීටර් පහක් (05) ද වශයෙන් වූ භූමි පරිශ්‍රය;

   *(ආ)*සිව් දිශාවෙන් මීටර් දෙකක (02) වපසරිය ද සහිත ගල් ආසනය; *සහ*

   *(ඇ)*දෙපසට මීටර් දෙකක (02) වපසරිය සහිත පියගැට පෙළ (උතුරු අක්ෂාංශ $7^0$331140"N හා නැගෙනහිර දේශාංශ $80^0$378013"E).

3. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩිගමුව 21 ග්‍රාම නිලධාරි වසමට අයත් කඩිගමුව නාගවනාරාම මහා විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය, ටැම්පිට විහාර දෙක, සංඝාවාසය, වටදාගෙය, පත්තිනි දේවාලය, ධර්මශාලාව සහ උතුරු දෙසින් සංඝාවාසයේ සිට හා දකුණු දෙසින් පත්තිනි දේවාලයේ සිට මීටර් දෙකක් (02) ද නැගෙනහිර දෙසින් ඉහළ ටැම්පිට විහාරයේ සිට හා බටහිර දෙසින් පැරණි ධර්මශාලාවේ සිට මීටර් පහක් (05) ද වශයෙන් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $7^0$31'39.85"N හා නැගෙනහිර දේශාංශ $80^0$42'68.35"E).

4. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දැලිවල 05 ග්‍රාම නිලධාරි වසමට අයත් නුගවෙල ග්‍රාමයේ පිහිටි දේවාලේවත්ත නමින් හඳුන්වන ස්ථානයේ ඇති පත්තිනි දේවාලය හා ඒ වටා සිව්දිශාවෙන් මීටර් පහක් (05) සහිත වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $7^0$ 33521"N හා නැගෙනහිර දේශාංශ $80^0$384336"E).

5. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරෙම්පොල 10 බී ග්‍රාම නිලධාරි වසමට අයත් කුරෙම්පොල ග්‍රාමයේ පිහිටි මැදගොඩැල්ල නමින් හඳුන්වන ස්ථානයේ ඇති ටැම්පිට විහාරය සහ ඒ වටා මීටර් දෙකක (02) භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $7^0$ 31'66.61"N හා නැගෙනහිර දේශාංශ $80^0$38'39.37"E).

6. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොළදණ්ඩ - 148 ග්‍රාම නිලධාරි වසමට අයත් මොළදණ්ඩ ග්‍රාමයේ පිහිටි කුඹල්වතුමුල්ල පුරාණ විහාර භූමියේ ඇති පුවරු ලිපිය හා ඒ වටා අඩි දෙක (02) භූමි පරිශ්‍රය.

7. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දැඹව ඊ 430 ග්‍රාම නිලධාරි වසමට අයත් දැඹව පුරාණ විහාර භූමියේ ඇති ටැම්පිට විහාරය සහ ඒ වටා අඩි දහයක (10) භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $7^0$ 69'43.8"N හා නැගෙනහිර දේශාංශ $80^0$ 55'25.68"E).

8. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඊ 438 සී තෙන්නකෝන්පුර ග්‍රාම නිලධාරි වසමට අයත් තෙන්නකෝන්පුර ග්‍රාමයේ පිහිටි ශ්‍රී ශෛලබිම්බාරාම පුරාණ විහාර භූමියේ ඇති කටාරම් කෙටූ ගල්ලෙන සහ එහි සිට සිව් දිශාවෙන් අඩි විස්ස (20) බැගින් වූ භූමි පරිශ්‍රය සහ ලෙනට ප්‍රවිශ්ටවීම සඳහා අඩි හයක් (06) පළලින් යුතු වූ මාර්ගය (උතුරු අක්ෂාංශ $7^0$ 82'58"N හා නැගෙනහිර දේශාංශ $80^0$ 62'21.11"E).

9. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්මඩුවවත්ත 53 ඒ ග්‍රාම නිලධාරි වසමට අයත් දොඩන්දූව (ගම්මඩුවවත්ත) ග්‍රාමයේ පිහිටි කුමාර මහ විහාර භූමියේ ඇති පැරණි ධර්මශාලාව සහ සණ්ඨාර කුලුණ (උතුරු අක්ෂාංශ $6^0$ 06'44.95"N හා නැගෙනහිර දේශාංශ $80^0$ 07'29.65"E).

10. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වටගෙදර අංක 337/ඒ ග්‍රාම නිලධාරි වසමට අයත් වටගෙදර ශ්‍රී සුධර්මාරාම පුරාණ පොත්ගුල් විහාර භූමියේ ඇති ටැම්පිට ප්‍රතිමා ගෘහය සහ ඒ වටා අඩි පහ (05) බැගින් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $5^0$59'25.1"N හා නැගෙනහිර දේශාංශ $80^0$ 32'21.5"E).

11. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අමරතුංගම, අංක 222 ග්‍රාම නිලධාරි වසමට අයත් අමරතුංගම පුරාණ විහාර භූමියේ ඇති චෛත්‍ය ගොඩැල්ල සහ ඒ වටා මීටර් පනහක (50) භූමි පරිශ්‍රය ද ගොඩනැගිලි නටබුන් හා ඒ වටා මීටර් පහක (05) භූමි පරිශ්‍රය.

12. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජදුර 197 ග්‍රාම නිලධාරි වසමට අයත් ජදුර ග්‍රාමයේ පිහිටි වෙලගත්වල පුරාණ රජමහා විහාර භූමියේ ඇති චෛත්‍ය ගොඩැල්ල සහ ඒ වටා මීටර් පනහක (50) භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $6^0$ 9'5"N හා නැගෙනහිර දේශාංශ $80^0$ 53'22"E)

13. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උස්වැව 225 ග්‍රාම නිලධාරි වසමට අයත් උස්වැව මිලක්ඛතිස්ස රජමහා විහාර භූමියේ ඇති චෛත්‍ය ගොඩැල්ල සහ ඒ වටා මීටර් පනහක (50) භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $6^0$14'46"N හා නැගෙනහිර දේශාංශ $80^0$ 51'58"E)

14. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බඳුන්ගල 181 සී ග්‍රාම නිලධාරි වසමට අයත් වල්පොල ග්‍රාමයේ පිංගොඩවත්ත නමින් හඳුන්වන ඉඩමේ ඇති පැරණි නිවස හා ඒ වටා මීටර් එකයි දශම පහක (1.5) භූමි පරිශ්‍රය.

15. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැළිජය 157 - සී, ග්‍රාම නිලධාරි වසමට අයත් බෝගන්දන ග්‍රාමයේ පිහිටි බෝගන්දන විහාර භූමියේ ඇති පැරණි ස්තූප ගොඩැල්ල සහ ඒ වටා සිව්දිශාවට මීටර් දහයක් (10) බැගින් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $6^0$42'56.3"N හා නැගෙනහිර දේශාංශ $80^0$ 52'19.6"E)

16. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 156 කිරවනාගම ග්‍රාම නිලධාරි වසමට අයත් කිරවනාගම මාතිකාරාම විහාර භූමියේ ඇති පැරණි ආවාස ගෙය, ප්‍රතිමා ගෘහය සහ එම එක් එක් ස්මාරක වටා මීටර් පහක් (05) බැගින් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $6^0$44'16.31"N හා නැගෙනහිර දේශාංශ $80^0$ 55'55.41"E)

EOG 03 - 0187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.